ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසිය -2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා පොලීසියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා පොලීසියේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා පොලීසිය, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත්කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා පොලීසියේ කොට්ඨාස කාර්යාල 33ක පවත්වාගෙන ගොස් තිබූ රජයේ නිලධාරින්ට අත්තිකාරම් “බී” පාලන ගිණුම් ශේෂ සහ කේවල ණයශේෂ එකතුව අතර රු.34,184,622ක නොසැසඳීමක් විය.	2025.03.31 දිනට කොට්ඨාස කාර්යාල පාලන ගිණුම් ශේෂ හා කේවල ණයශේෂ එකතුව රු.33,606,532ක් දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇති බව.	වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.
(ii)	ශ්‍රී ලංකා පොලීසියේ කොට්ඨාස කාර්යාල 50කට අදාළව සේවයෙන් විශ්‍රාම ගිය, සේවය අතහැර ගොස් සිටි කාර්යමණ්ඩල ණයශේෂ ද දැනට සේවයේ නියුක්ත ණය අයවන කාර්යමණ්ඩලයේ අත්තිකාරම් “බී” ගිණුමේ දක්වා තිබීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබෙන රු.1,131,182,421ක ණයශේෂය නිවැරදි නොවී ය.	කොට්ඨාස කාර්යාල විසින් කේවල ණයශේෂ තුළ ඇතුළත්කර ඇති අතර, එම ශේෂ නිවැරදිකර ගැනීමට කටයුතු කරන ලෙස කොට්ඨාස කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇත.	වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) දේපළ පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා පොලීසිය සතුව 2024 දෙසැම්බර් 31 දිනට සිටින රු.221,106,567ක් වටිනා අශ්වයින්	ශ්‍රී ලංකා පොලීසිය සතුව පවතින අශ්වයින් සහ සුනඛයින් 2024 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොමැත. කෙසේ වුව ද, 2025	ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදි

	36ක් සහ සුනඛයින් 306ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ ශේෂයන්ගේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය වන ඒසීඒ 06 ආකෘතිය තුළ ගිණුම්ගතකර නොතිබුණි.	වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් ලබාගන්නා ගිණුම් කේතයක් යටතේ මෙම අශ්වයන් සහ සුනඛයන් අවසාන ගිණුම තුළ ඇතුළත් කිරීමට සටහන්කර ගත් බව විගණනයට දන්වා ඇත	හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම්ගතකර තිබිය යුතු ය.
(ii)	සමාලෝචිත වර්ෂයේ තුළ දී ශ්‍රී ලංකා පොලීසිය ප්‍රාග්ධන වියදම ලෙස රු.4,063,859,910ක් වියදමක් දරා තිබුණ ද, ප්‍රාග්ධන වත්කම් ලෙස රු.499,877,068ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වත්කම් රු.3,563,982,842ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.	2024 වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ඇතුළත්කර ඇති වත්කම් වටිනාකම රු.2,003,084,125කි. කෙසේ වුව ද, 2025 වර්ෂය තුළ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් මගින් ශ්‍රී ලංකා පොලීසියේ සියලුම ගෙවීම් කොට්ඨාසවල ගණකාධිකාරීවරුන් හා විෂය නිලධාරින් සඳහා වත්කම් කළමනාකරණය හා ගිණුම්ගත කිරීම පිළිබඳව දින 2ක පුහුණුවෙන් පසුව ශ්‍රී ලංකා පොලීසිය සතුව මෙතෙක් ගිණුම්ගත නොකරන ලද වත්කම් හා එදිනෙදා මිලදීගන්නා සියලුම වත්කම් නිසිපරිදි ගිණුම්ගත කිරීමට සැලසුම්කර ඇති බව විගණනයට දන්වා ඇත.	සියලුම ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු ය.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා පොලීසිය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ස්ථාවර වත්කම් ලේඛනය**		
	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය පිළියෙලකර පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ දී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගත යුතුවීම.

(ii) බැරකම් පිළිබඳ ලේඛනය

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	2024 අවසාන ගිණුම්හි ඇමුණුම iv යටතේ වැය විෂය අංක 2001 සිට 2104 දක්වා ඉදිරිපත්ව ඇති බැඳීම් හා බැරකම් පිළිබඳ විස්තර ඉදිරිපත්කර තිබෙන බව දන්වා ඇත.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුවීම.

1.6.2 නොසැසඳීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iv) ආකෘතියේ බැරකම් ශේෂය රු.163,154,357ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA -92 වාර්තාව) අනුව බැරකම් ශේෂයක් නොවුයෙන් රු.163,154,357ක වෙනසක් විය.	2024 CIGAS මගින් කොට්ඨාස විසින් භාණ්ඩාගාරයට ගිණුම් වාර්තා කිරීමේ දී ඉදිරිපත් නොවූ එහෙත් අවසාන ගිණුම සකස්කිරීමේ දී අනාවරණය වූ බැරකම් අවසාන ගිණුමේ දක්වා ඇති බව.	සියලුම බැරකම් භාණ්ඩාගාරයට වාර්තාකර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA-82) වාර්තා මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු ය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ දී අත්තිකාරම් "බී" ගිණුමෙන් රු.2,129,162ක් වංචනික ලෙස මුදල් ලබාගෙන තිබූ නමුත්, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා හානි ප්‍රකාශනයේ ඒ පිළිබඳව වාර්තාකර නොතිබුණි.	ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කරන බව දන්වා ඇත.	මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා හානි නිවැරදිව ඉදිරිපත් කළ යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 05ක් සඳහා මු.රෙ. 66 මගින් සියයට 25 සිට සියයට 155 දක්වා ප්‍රතිපාදන වැඩිකර ගෙන තිබුණු අතර, වැය විෂයන් 08ක් සඳහා මු.රෙ. 66 මගින් සියයට 27 සිට 84ක් දක්වා ප්‍රතිපාදන අඩුකරගෙන තිබුණි. සංශෝධනය කරන ලද ප්‍රතිපාදනවලින් වැය විෂයන් 15ක සියයට 25 සිට සියයට 100ක් දක්වා වියදම් සිදුනොකර ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.	මෙම ප්‍රතිපාදන මාසික ආහාර හා නවාතැන් දීමනාව ගෙවීමට අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ බව විගණනයට දන්වා ඇත.	නිසිඅධ්‍යානයකින් යුතුව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට වගබලාගත යුතු ය.
(ආ)	වැය විෂය අංක 225-1-1-0-1003 යටතේ වෙනත් දීමනා ගෙවීම සඳහා මුලික ඇස්තමේන්තුව ඉක්මවා රු.21,707,000,000ක් මු.රෙ. 66 මගින් සහ රු.9,205,100,000ක් පරිපූරක ඇස්තමේන්තුව මගින් ද එකතුව ලෙස රු.30,912,100,000ක් සමාලෝචිත වර්ෂය තුළ දී මාරුකරගෙන වෙනත් දීමනා ගෙවීම සඳහා යොදාගෙන තිබුණි. එය මුලික වියදම් ඇස්තමේන්තුව මෙන් සියයට 92ක් විය.	2024 මාර්තු මස 05 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/24/0335/626/004 අනුව මෙම ආයතනය වෙත වෙන්කර ඇති සමස්ත ප්‍රතිපාදන අරපිරිමැස්මෙන් යුතුව භාවිතාකරමින් සියලුම නිලඇඳුම් කාර්යමණ්ඩලය සඳහා ආහාර හා නවාතැන් දීමනාවක් ගෙවීම සඳහා කටයුතු කිරීම හේතුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන සපයා ගැනීමට අනෙකුත් වැය විෂයන් මගින් ඉතිරිවන ප්‍රතිපාදන රු.21,707,000,000ක මුදලක් වැය විෂය 1003 වෙත මාරුකිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	නිසිඅධ්‍යානයකින් යුතුව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට වගබලාගත යුතු ය.
(ඇ)	2021-2024 කාලසීමාව තුළ ඉන්දියානු ණය වැඩසටහන යටතේ පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාහන මිලදීගැනීම සඳහා රුපියල් මිලියන 17,400ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 300ක වාහන මිලදීගැනීම සඳහා වෙන්කර තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි.	ඉන්දියානු ණය වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ වෙන්කරනු ලැබූ රුපියල් මිලියන 348ක මුදලක් සඳහා වන ඇස්තමේන්තුව, වාහන අමතර කොටස් මිලදීගැනීම සඳහා වන අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය ඉල්ලීම පොලිස්පති විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මගින් නිර්දේශකර 2023.08.23 දිනැතිව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය	අදාළ අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රතිපාදන භාවිතයටගත යුතු යි.

	වෙත යොමුකර ඇති නමුත්, ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය මගින් එම ලිපිවලට ප්‍රතිචාර දක්වා නොමැති බැවින් මෙලෙස වෙන්කළ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	

3.2 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු.45,837,000ක පරිත්‍යාග මුදලින් ඉතිරිව පවතින රු.11,503,191ක මුදල අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ අතර, ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවී ය.	මෙම මුදල ත්‍රස්ත මර්ධන නිරීක්ෂණ මධ්‍යස්ථානයේ පරිගණක පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා භාවිතා කිරීමට යෝජනාකර ඇත. මේ සඳහා සාර්ක් සමුළුවෙන් අනුමැතිය ලැබෙන තෙක් මෙම මුදල රඳවා ගැනීමට සිදුවන අතර, එය රජයේ ආදායමට බැරකිරීමට නොහැකි බව.	අදාළ අරමුණු ළඟාකර ගැනීම සඳහා තැන්පතු යොදවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු ය.
(ආ)	තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම සඳහා තැන්පත් කරන පොදු තැන්පත් ගිණුමේ 2017 වර්ෂයේ සිට ගිණුම්ගතකර තිබෙන රු.1,187,722ක් ද ඇතුළුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන රාජසන්තකකර තිබූ රු.7,084,972ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට රඳවා තබාගෙන ඇත.	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙලෙස රාජසන්තක කරන ලද රු.7,084,972ක මුදල යොදාගෙන ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය වෙත පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා කාර්යාලයීය උපකරණ මිලදීගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, ඒ සඳහා ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙය රජයේ ආදායමට බැරකළ නොහැකි බව දන්වා ඇත.	රාජසන්තකකර තිබූ මුදල් අනුමැතිය ලැබූ කාර්යය සඳහා යොදාගත යුතු ය.
(ඇ)	වසර 2ක් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුව ද, තැන්පතු ගිණුම් 4ක රු.39,907,333ක තැන්පතු නිරවුල්කර නොතිබුණු අතර, ඒ තුළ වසර 05 ඉක්ම වූ තැන්පතු 02ක වටිනාකම රු.14,620,714ක් විය.	2024 දෙසැම්බර් 31 දිනට තිබූ රු.39,907,337ක වසර 2 ඉක්ම වූ තැන්පතුවලින් මේ වන විට ඉතිරිව පවතින තැන්පතු වටිනාකම වන්නේ රු.37,680,836කි. එලෙස ඉතිරි තැන්පතු තවදුරටත් රඳවාගැනීමට හේතු දක්වා ඇත. එමෙන්ම වසර 05 ඉක්ම වූ තැන්පතු දෙකක වටිනාකම පිළිවෙලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රු.1,877,722, ගොඩනැගිලි කොට්ඨාසය රු.66,654 හා ගොඩනැගිලි කොට්ඨාසය රු.12,273,133ක ශේෂයන් තවදුරටත් රඳවා තබාගැනීමට සිදුවන බව දන්වා තිබුණි.	කල්ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැරකළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) බල අපරාධ වාර්තාවීම හා විසඳීම		
මනුෂ්‍ය ඝාතනය හා බරපතල තුවාල සිදුකිරීම යන බල අපරාධ ගත්විට 2019 - 2024 කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 1373, 1356, 1375, 1482, 2030 හා 1903ක් වශයෙන් වාර්තා වී තිබූ අතර, එය පෙර වර්ෂයට වඩා සුළු අඩුවීමක් වුව ද, 2019 වර්ෂයට සාපේක්ෂව මනුෂ්‍ය ඝාතන සිදුකිරීම් සියයට 16කින් ද, බරපතල තුවාල සිදුකිරීම් සියයට 51කින් ද වර්ධනය වී තිබුණි.	මෙවැනි අපරාධ සිදුකරන්නන් වහාම අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනේ සියලු පොලිස් ස්ථාන විසින් අඛණ්ඩ මෙහෙයුම් පවත්වාගෙන යනු ලබන අතර, විදේශීය රටවල සිට අපරාධ සිදුකිරීමට ආධාර කරනු ලබන අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ මෙහෙයුම් පවත්වාගෙන යනු ලබන බව දන්වා ඇත.	බරපතල අපරාධ අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතු ය.
(ආ) කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම පිළිබඳව		
කාන්තාවන්ට එරෙහිව සිදු වී තිබෙන බල අපරාධ කාණ්ඩ 14ක් ශ්‍රී ලංකා පොලීසිය හඳුනාගෙන තිබුණු අතර, අනුයාත වර්ෂ 03ක් තුළ එයින් මිනීමැරීම, ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදුකිරීම සහ බරපතල ලෙස ලිංගික අපයෝජනය කිරීම යන බල අපරාධ 2022 - 2024 කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 459, 589 හා 567ක් වශයෙන් ප්‍රමාණාත්මක ඉහළයාමක් වාර්තා වී තිබේ.	කාන්තාවන්ට එරෙහි අපරාධ හා හිංසනය අවමකිරීම සඳහා සමාජයේ සෑම පාර්ෂවයක්ම දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය විසින් සිදු කරමින් පවතින බව දන්වා ඇත.	කාන්තාවන්ට එරෙහිව සිදුවන බලඅපරාධ වාර්තාවීම අවමකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය.
(ඇ) ළමයින්ට එරෙහි බල අපරාධ වාර්තාවීම පිළිබඳව		
ළමයින්ට එරෙහිව සිදු වී තිබෙන බල අපරාධ කාණ්ඩ 15ක් ශ්‍රී ලංකා පොලීසිය හඳුනාගෙන තිබුණු අතර, එයින් මිනීමැරීම, ස්ත්‍රී දූෂණය (16 ට	ළමයින්ට එරෙහි අපරාධ හා හිංසනය අවමකිරීම සඳහා සමාජයේ සෑම පාර්ශවයක්ම දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා	ළමයින්ට එරෙහිව සිදුවන බලඅපරාධ වාර්තාවීම

අඩු කැමැත්ත ඇතිව හා කැමැත්ත නැතිව), ස්ත්‍රී දූෂණය බරපතල ලෙස ලිංගික අපයෝජනය සහ අපහරණය කිරීම යන බල අපරාධ 2022 - 2024 කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 2821, 2764 සහ 2907ක් ලෙස ප්‍රමාණාත්මකව වර්ධනය වී තිබුණි.	කාර්යාංශය විසින් සිදුකරමින් පවතින බව දන්වා ඇත.	අවමකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය.

(ඇ) රිය අනතුරු වාර්තාවීම

සමාලෝචිත වර්ෂයේ මාරක රිය අනතුරු 2272ක් වාර්තා වී තිබුණු අතර, ඉන් මියගිය සංඛ්‍යාව 2381ක් වූ අතර, බරපතල තුවාල ලැබූ සංඛ්‍යාව 6,762ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව මාරක රිය අනතුරු සියයට 3කින් ද, බරපතල තුවාල අනතුරු සියයට 10කින් ද, අනතුරු මගින් මියගිය සංඛ්‍යාව සියයට 3කින් ද වැඩි වී තිබුණි.	රිය අනතුරු වැළැක්වීම සඳහා නිලධාරීන් මාර්ග ආශ්‍රිත රාජකාරීවල අඛණ්ඩව නියුක්ත කරවීම, මාර්ග භාවිතාකරන විවිධ පාර්ශව දැනුවත්කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන බව දන්වා ඇත.	රිය අනතුරු අවමකර ගැනීම සහ මාර්ග භාවිතා කරන්නන්ගේ සහ පදිකයන්ගේ ආරක්ෂාව සැලසෙන ලෙස සියලු ක්‍රියාමාර්ගගත යුතු ය.

(ඉ) මත්ද්‍රව්‍ය අපරාධ වාර්තාවීම

ශ්‍රී ලංකා පොලිසිය මගින් අත්අඩංගුවට ගනු ලබන නිද්‍රාජනක ද්‍රව්‍ය වන ගංජා, අබිං, හෂිෂ්, හෙරොයින්, මොෆින්, කොකේන්, අයිස්, බාබුල්, මාවා, මත්පෙති, මත්මුද්දර සහ වේදනා නාශක පෙති වැනි සිද්ධීන් සඳහා නඩු පැවරීම් 2022 වර්ෂයේ දී 142,632ක් ද, 2023 වර්ෂයේ දී 175,781ක් ද සහ 2024 වර්ෂයේ දී 222,785ක් ද ලෙස 2022 වර්ෂයට සාපේක්ෂව 2024 සිද්ධීන් වාර්තා වීම සියයට 56කින් ඉහළගොස් තිබේ.	දිවයිනේ සියලු පොලිස් ස්ථාන සම්බන්ධ කරගෙන සිදුකරන වැටලීම් මගින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා අඛණ්ඩ මෙහෙයුම් පවත්වා ඇත. එමෙන්ම මුහුදු මාර්ග ඔස්සේ මත්ද්‍රව්‍ය මෙරටට ගෙන ඒම වැළැක්වීම සහ විදේශ රටවල සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂිත මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යන බව දන්වා ඇත.	මත්ද්‍රව්‍ය අපරාධ අවම කිරීම කඩිනම් අඛණ්ඩ ක්‍රියාමාර්ගගත යුතුව ඇත.

4.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 වර්ෂයේ දී ආරම්භකර තිබූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 2,585ක් වූ කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිලනිවාස ඉදිකිරීම, වැලිගම, කොල්ලුපිටිය, මල්ලාවි සහ මුලතිව් පොලිස් ස්ථානය ඉදිකිරීම හා නාරාහේන්පිට පොලිස් ස්ථානවල වැඩ අවසන්කිරීම යන ප්‍රමාද වූ ව්‍යාපෘති 06 සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 387ක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, වියදම රුපියල් මිලියන 309ක් විය. රථවාහන මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණු අතර, ප්‍රමාද වූ මෙම ව්‍යාපෘති 06හි වර්තමාන ප්‍රගතිය ද මන්දගාමීව පැවතීම නිසා ව්‍යාපෘති ආරම්භක අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.	මෙම ඉදිකිරීම්වල කාලප්‍රමාදයන් ඇත. විගණන හා කළමනාකරණ කමිටුවල ද මේ සඳහා විශේෂ අවධානය යොමුකර ඇති කරුණු වේ. එබැවින් මෙම වර්ෂය තුළ ඉතිරි වැඩ නිමකිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කාලප්‍රමාදයකින් තොරව ගත යුතු ය.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලයන් සඳහා Peak Cap 75,000ක් ඇමරිකානු ඩොලර් 414,000 (CIF) වටිනාකමකට (රු.93,455,119 බදු සහ සියලු දේශීය වියදම් ඇතුළත්ව) සැපයීම සඳහා 2010 වර්ෂයේ දී ආරක්ෂක අමාත්‍යාංශය විසින්	මෙම Peak Cap තොගය 2023 වර්ෂයේ දී පොලීසිය වෙත ලබාගැනීමට සිදු වූ අතර, එම Peak Cap 2023/2024 වර්ෂවල දී නිලධාරීන්ට බෙදාදීමට කටයුතුකර තිබෙන බව දන්වා ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව නිවැරදි අවබෝධයකින් යුතුව කටයුතුකර මහජන මුදල්වලට සිදුවන හානිය සම්පූර්ණයෙන්ම

	ප්‍රසම්පාදන කටයුතු සිදුකර 2011 පෙබරවාරි 11 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. 2011 අගෝස්තු 30 දින සැපයුම් ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් බේරුම්කරණය සඳහා යොමුවී තිබුණි. සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු සහ ප්‍රමාදවීම මත පොළිය හා විදේශ විනිමය අනුපාත වැඩිවීමේ අවාසිය ද ශ්‍රී ලංකා පොලීසියට දැරීමට සිදු වී තිබුණු අතර, සමථකරණ තීරණය අනුව Peak Cap 60,000ක් ගැනීම සඳහා රු.289,138,812ක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවා තිබුණු අතර මෙම ප්‍රතික්ෂේප කිරීම නිසා මුලින් එකඟ වූ විකුණුම් මිලට වඩා රු.මිලියන 195.7ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. මෙම සැපයුම සඳහා වසර 12ක් පමණ ගතවී තිබූ අතර ඒවායේ ගුණාත්මය පිලිබඳ ගැටළු මතු වී තිබූ බැවින් රු.මිලියන 28.07ක වටිනාකමක් වූ කැප් ප්‍රමාණයක් භාවිතයට නුසුදුසු තත්ත්වයේ ඉතිරිව පැවතුණි.		වැළැක්වීම සඳහා කටයුතු කළ යුතු යි.
(ආ)	රාජ්‍ය සේවකයන් හට නිවාස ලබාදීමේ අරමුණින් ආරම්භකර තිබූ හබරාදුව "නිලසෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රුපියල් මිලියන 3.8 බැගින් රුපියල් මිලියන 729.6කට නිවාස 192ක් මිලදීගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළැඹ, 2019 අප්‍රේල් 02 දින වන විට රුපියල් මිලියන 500ක අත්තිකාරම් ගෙවා තිබුණි. 2024 වර්ෂය අවසන් වන විට නිවාස පවරාගෙන හෝ ව්‍යාපෘතියෙන් කිසිදු නිවසක් පොලිස් නිලධාරින්ට ලබා දී නොතිබුණි. නිවාස 128ක් පමණක් පවරාගැනීමට යෝජනා වී අවසන් එකඟතාවයක් ඇති වී නොතිබූ අතර, රු.486,400,000 ක් වූ එම නිවාස ඒකක 128 සඳහා	මෙම නිවාස ව්‍යාපෘතියට අදාළ පැවරුම් ඔප්පු සකස්කරමින් පවතින බව දන්වා ඇත.	ගෙවා තිබෙන රජයේ මුදල් සඳහා නිවාස ව්‍යාපෘතිය පවරාගැනීම කඩිනම්කළ යුතු අතර, වැඩිපුර ගෙවා තිබෙන මුදල වහාම ආපසු අයකරගත යුතු ය.

රු.500,000,000ක් ගෙවාතිබීම නිසා රු.13,600,000ක රජයට අයත් මුදලක් බාහිර පාර්ශවයක තුළ වසර 06කට වැඩි කාලයක් රඳවා තැබීමට ඉඩහැර තිබීම මගින් රජයට පාඩුවක් සිදුකර තිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබූ කොළඹ නාගරික රථවාහන කොට්ඨාසයේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2024 ඔක්තෝම්බර් මාසය වන විට එකඟ වූ වටිනාකමින් සියයට 61ක් එනම් රු.237,731,881ක මුදලක් කොන්ත්‍රාත්කරුට සහ රු.8,797,704ක් උපදේශන සේවා ආයතනයට ගෙවා තිබූ නමුත්, ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 46ක් පමණ විය. 2021 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණු මෙහි වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුවක් ප්‍රකාරව ඉදිකිරීම් සමාගම ඇවරකර තිබීම හේතුවෙන් විධිමත් පරිදි ඉදිකිරීම් නොකිරීමේ වගකීම කොන්ත්‍රාත්කරුට පැවරිය නොහැකි විය.	ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2025 වර්ෂයේ දී භාර දී තිබේ.	ඉදිකිරීම් කාර්යයන් ආරම්භයේ සිට අවසානය දක්වා ඉතාමත් හොඳ සුපරීක්ෂණයන් යටතේ සිදුකර, ඉදිකිරීම් මගින් බලාපොරොත්තු වන අරමුණ කාලප්‍රමාදයකින් තොරව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.
(ආ)	2016 වර්ෂයේ රු.89,794,190ක වටිනාකමකට වැඩ ආරම්භ කරන ලද වැලිගම පොලිස් ස්ථානයේ ඉදිකිරීම් කටයුතු කාලය දීර්ඝකිරීම් ද ඇතුළුව 2019 පෙබරවාරි 06 දින වන විට අවසන් කළ යුතු වුවත්, 2025 ජනවාරි මාසය වන තෙක්ම ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණු අතර, ඒ සඳහා 2019 අප්‍රේල් 29 දින වන විට රු.64,664,752ක් ද ගෙවා තිබුණි.	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රදානය කළ ආයතනය නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඉතිරි වැඩ නිම කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2025 වර්ෂයේදී ලබා දී ඇත.	කොන්ත්‍රාත්කරු මගින් නියමිත කාලය තුළ ඉදිකිරීම් අවසන් කරවා ගැනීම සඳහා සියලු ක්‍රියාමාර්ගගත යුතුව ඇත.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් කාර්යාල 80ක්, පොලිස් ස්ථාන 121ක්, පොලිස් මුරපොළ 15ක්, නිලනිවාස සහ හටනිවාස 106ක් සහ ගබඩා 09ක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි 331 කුලී ගෙවීමේ පදනමට ලබාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි කුලිය ලෙස රු.738,006,713ක් ගෙවා තිබුණි. ඒ තුළ මාසයකට රු.10,400,000 බැගින් වර්ෂය සඳහා රු.124,800,000 ගෙවා ශ්‍රී ලංකා පොලිසියේ නීති විරෝධි වත්කම් හෝ දේපළ විමර්ශන කොට්ඨාසය, ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය, තැනැත්තන් වෙළඳාම් ජාවාරම මැඩලීම හා සමුද්‍රීය ආරක්ෂක කොට්ඨාසය සහ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසය පවත්වාගෙන යාම සඳහා කොළඹ 05 ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක් ද විය.	ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන දීර්ඝකාලීන සැලැස්මකට අනුව ඉදිකිරීම් කටයුතු සිදුකළ ද, අදාළ වැය විෂයන්වලට වෙන්කරන ප්‍රතිපාදන සීමාසහිත වන බැවින්, ඉදිකිරීමේ කටයුතු සිදුකිරීමේ දී ගැටළු පැනනගින බැවින් ඉදිකිරීම් කටයුතු සඳහා කාලයක් ගත වන බව දන්වනු කැමැත්තෙමි.	වැඩ ආරම්භකර තිබෙන ඉදිකිරීම් කඩිනමින් අවසන්කර අදාළ අංශ එම ස්ථානවල ස්ථානගත කිරීම සහ ගොඩනැගිලි අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන දීර්ඝ කාලීන සැලසුමකට අනුව කටයුතු කළ යුතු ය.
(ඇ)	සමාලෝචිත වර්ෂය සඳහා රු.4,270,000ක් වැයකර 1931 වර්ෂයට පෙර සිට කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලක ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථාන පවත්වාගෙන යාම සිදුකරන නමුත් සුදුසු ස්ථානයක ශ්‍රී ලංකා පොලීසිය සඳහාම ගොඩනැගිල්ලක් ඉදිකර මෙම පොලිස් ස්ථානය ඒ තුළ ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා පොලීසියට නොහැකි වී තිබුණි.	මෙම ගොඩනැගිල්ල අත්පත්කර ගැනීමට කටයුතු කළ යුතු ය. එය කොළඹ අගරදගුරු පදවිය, කරන ලද ඉල්ලීම මත අදාළ කටයුතු අත්හිටුවා ඇත. මෙම ප්‍රදේශයේ රජය සතු ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් පිළිබඳව සොයා බලමින් පවතී.	දීර්ඝකාලීන මෙවැනි ස්ථාන සඳහා විකල්ප රජයේ ඉඩම් පිළිබඳ අවධානය යොමුකළ යුතු ය.

(ඉ)	ඉංගිරියේ සේවස්ථ පුහුණු ඒකකයක් සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ වැඩ ආරම්භකර රුපියල් මිලියන 8.8ක් වැයකර ඉදිකිරීම් අතරමග නවතා තිබුණි.	අක්කර 4යි රූඩ් 2යි පර්චස් 7.2ක් වූ මෙම ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් 2024.02.21 දින බාර දී ඇති බව දන්වා ඇත.	ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඊ)	පොලිස් අශ්වාරෝහක කොට්ඨාසය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩම 2024 දෙසැම්බර් 31 දින වන විටත් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.	අත්කර ගැනීමට මූලික පිඹුර සකස්කරමින් පවතී.	ඉඩම හැකි ඉක්මනින් පවරාගැනීමට අවශ්‍ය පියවරගත යුතු ය.

4.5 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ද්විත්ව මනුෂ්‍ය ඝාතනයට අදාළව සිදුකරන ලද පරීක්ෂණය අනුව 2019 වර්ෂයේ දී පොලිස් නිලධාරීන් 15දෙනෙකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගතකර තිබුණි. පසුව ඔවුන්ගේ කලත්‍රයන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත කළ ඉල්ලීම් මත 2022 පෙබරවාරි 25 දිනැති නියෝගය අනුව පොලිස් නිලධාරීන් තිදෙනෙකුගේ කලත්‍රයන් වෙත එකතුව රු.4,741,056ක් අඩවැටුප් ලෙස 2023 නොවැම්බර් වන විට ගෙවා තිබුණි. මෙම ද්විත්ව ඝාතනයට අදාළ පරීක්ෂණ, අධිකරණ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය හා සෙසු නිලධාරීන්ට ගෙවීම් කළ අඩවැටුප් පිළිබඳව මෙන්ම පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වාර්තාකිරීම් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවී ය. මෙලෙස සැකකරුවන් ලෙස විමර්ශන මගින් හඳුනාගත් නිලධාරීන්ගේ කලත්‍රයන්	ද්විත්ව මනුෂ්‍ය ඝාතනයට අදාළව සිදුකරන පරීක්ෂණයේ දී හෙළි වූ කරුණු මත අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන්ට ගෙවනු ලබන අඩවැටුප් පිළිබඳ තොරතුරු හා ද්විත්ව ඝාතනයට අදාළ පරීක්ෂණ සහ අධිකරණ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය පරීක්ෂාකර දැනුම්දීමට කටයුතු කරන බව දන්වා ඇත.	අධිකරණ තීන්දු ලබාදෙන තුරු ගෙවීම් කටයුතු සිදුනොකළ යුතු ය.

වෙත දීර්ඝකාලීනව අඩවැටුප් ගෙවීම වැරදි පූර්වාදර්ශයක් විය හැකි බව විගණනයේ දී බැහැරකළ නොහැකි විය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 1,376ක ගෙන් අයවිය යුතු ණයශේෂවල එකතුව රු.39,300,176ක් වූ අතර, එම ණයශේෂ තුළ වර්ෂ 05ට වැඩි නිලධාරීන්ගේ හිඟ හිටි ණයශේෂවල එකතුව රු.39,300,176ක් විය.	හිඟ ණයශේෂ අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර තිබෙන අතර, එම කමිටුව මගින් කොට්ඨාස කාර්යාලවල හිඟ ණයශේෂ විස්තර ලබාගෙන ඒ අනුව හිඟ ණයශේෂ අයකර ගැනීමට අංශය පියවරගනිමින් පවතී.	හිඟ ණය අයකර ගැනීම සඳහා අදාළ වන සියලු ක්‍රියාමාර්ගගත යුතු යි.
(ආ)	ජීවමාන වීඩියෝ දර්ශන ලබාගනිමින් අවේක්ෂණ කටයුතු සිදුකිරීම, මාර්ග නීති උල්ලංඝණය කිරීම් නිරීක්ෂණය කිරීම සහ කොළඹ නගරයේ රථවාහන ගමනාගමනය පාලනය කිරීම, කොළඹ නගරයට පැමිණෙන සහ කොළඹ නගරයේ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම ආදී වූ සුවිශේෂ කාර්යභාරයන් ඉටුකිරීමේ අරමුණින් කොළඹ නගරයේ ප්‍රධාන ස්ථාන 33ක කැමරා 108ක් ස්ථාපිතකර තිබුණ ද, 2024 අගෝස්තු වන විට ඉන් ස්ථාන 06ක් සම්පූර්ණයෙන් ද ඇතුළුව ස්ථාන 23ක කැමරා 37ක් අක්‍රීය වී තිබුණි.	මෙම කැමරා පද්ධතිය සඳහා වසර 14ක කාලය ගතවී තිබෙන බැවින් අක්‍රීය වන කැමරා නැවත අලුත්වැඩියා කළ නොහැක. එබැවින් 2025 වර්ෂයේ දී නවීන තාක්ෂණයට යාවත්කාලීන කිරීම යෝජනා සහ ඇස්තමේන්තු සකස්කර අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත.	මෙම කැමරා පද්ධතිය නවීන තාක්ෂණයට යාවත්කාලීනකර ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කළ යුතු යි.
(ඇ)	කැමරා පද්ධතිය ආරම්භ කරන කාලය වන විට පරිගණක මෙහෙයුම් පද්ධතිය (OS) ලෙස භාවිතා කරන ලද Windows XP යෙදුම භාවිතා කරමින් මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණු අතර, 2014 වර්ෂයෙන් පසු මයිකොසොෆ්ට් ආයතනය	මෙම CCTV කැමරා පද්ධතිය නවීකරණයට වැඩිදියුණු කිරීමට 2025 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හා නවීන තාක්ෂණයට යාවත්කාලීන කිරීමට යෝජනාවලියක් සහ ඇස්තමේන්තුවක් සකස්කර ඊට අදාළ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත.	පරිගණක මෙහෙයුම් පද්ධතිය නව තාක්ෂණයට යාවත්කාලීන කළ යුතු ය.

	Windows XP සඳහා ලබාදෙන පහසුකම් නවතා දමා තිබුණ ද, 2024 අගෝස්තු 15 දින වන විටත් කැමරා පද්ධතිය Windows XP යෙදුම මගින් මෙහෙයවමින් පැවතුණි. මෙසේ ඉතා පැරණි තාක්ෂණයක් භාවිතාකිරීම හේතුවෙන් කැමරා පද්ධතිය පවත්වාගෙන යාම දැඩි අපහසුතාවයකට පත්ව තිබුණු අතර, නව තාක්ෂණය කරා යොමුවීමේ අවශ්‍යතාවය විගණනය නිරීක්ෂණය කෙරේ.		
(ඇ)	1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය අනුව සංශෝධන සිදුකළ යුතු ක්ෂේත්‍ර 16ක් ද 2014 වර්ෂයේ දී හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් යාවත්කාලීනකර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද, 2025 වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි.	නීති කෙටුම්පත් සම්පාදක අමාත්‍ය විසින් පොලීසියේ නිරීක්ෂණ ලබාගැනීමෙන් පසු අවසන් කෙටුම්පත් සකස්කර අවසන්ව ඇත.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය සිදුකළ යුතු ය.

05. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණ	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානවල රාජකාරී ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්යමණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාසය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශකළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ	මේ පිළිබඳ අධ්‍යයනයක්කර අනුමත කාර්යමණ්ඩලය වැඩිකර ගැනීමට හැකි වුව ද, කොට්ඨාස, පොලිස් ස්ථාන වශයෙන් අවශ්‍ය කාර්යමණ්ඩලය හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, ශ්‍රී ලංකා පොලීසියට අයත් නිලඇඳුම් කාර්යමණ්ඩලයේ පවතින කාර්යමණ්ඩල හිඟය නිසා එය සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත.	පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යයනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය

	කාර්යමණ්ඩලය ස්ථානගත කිරීම නිසික්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි.		මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු ය.
(ආ)	පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 60,000ක් වුව ද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 30,983ක් පමණක්වීම මත පුරප්පාඩු 29,017ක් පැවතුණි. මෙලෙස පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාවෙන් සියයට 48ක පමණ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම, ශ්‍රී ලංකා පොලීසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි.	2024 වර්ෂයේ පොලිස් කොස්තාපල් තනතුරු සඳහා 400දෙනෙකු බඳවාගැනීමට කටයුතු කළ අතර, 2025 ජනවාරි මාසයේ දී පොලිස් කොස්තාපල්වරු 1,825දෙනෙකු බඳවාගැනීමට කටයුතුකර තිබේ.	අනුමත සංඛ්‍යාවට අදාළ පුරප්පාඩු පිරවීම, උසස්වීම් ලබාදීම සිදුකළ යුතු ය.
(ඇ)	කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 10,000ක් වුව ද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 5,973ක් පමණක්වීම මත පුරප්පාඩු 4027ක් පැවතුණි. මෙලෙස කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාවෙන් සියයට 40ක පමණ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම, ශ්‍රී ලංකා පොලීසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි.	නව බඳවාගැනීම් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	අනුමත සංඛ්‍යාවට අදාළ පුරප්පාඩු පිරවීම, උසස්වීම් ලබාදීම සිදුකළ යුතු ය.
(ඈ)	ශ්‍රී ලංකා පොලීසියේ සහායක සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත සංඛ්‍යාව 104ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය සංඛ්‍යාව 07ක් වීම මත පුරප්පාඩු 97ක් පැවතුණි. මෙලෙස පොලිස් සහායක සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියයට 93ක්ම පැවතීම ශ්‍රී ලංකා පොලීසියේ කාර්යන් පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.	බඳවාගැනීමේ කාර්යය පටිපාටි අනුමතකර ගැනීමෙන් පසුව අවශ්‍ය බඳවාගැනීම් ඉදිරියේ දී සිදුකිරීමට නියමිතයි.	සහායක සේවයට අයත් විවිධ තනතුරු නාම සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි කඩිනමින් අනුමතකර ගැනීමට කටයුතු කළ යුතු ය.